# ත්‍රස්තවාදයේ සිට ප්‍රතිසාධනය දක්වා: ජාත්‍යන්තර අත්දැකීම්වලින් උගත් පාඩම්

වාර්තාකරණය ඇඩම් කොලින්ස් සහ මලින්ද මීගොඩ, LKI

**ත්‍රස්තවාදයේ සිට ප්‍රතිසාධනය දක්වා වූ කමිටු සාකච්ඡාවේ ප්‍රධාන පියවර තුනකි: ජාත්‍යන්තර අත්දැකීම්වලින් උගත් පාඩම් -**

**1. ලෝකය පෙරට වඩා වේගවත් හා විසිරී ඇති නව ආකාරයක ත්‍රස්තවාදයකට මුහුණ දී සිටින අතර, එම නිසා ඒවා සොයා ගැනීම හා පාලනය කිරීම දුෂ්කරය.**

**2.ඵලදායි ලෙස ත්‍රස්ත විරෝධී උපාය මාර්ග සඳහා ආරක්ෂාව සහතික කිරීමේ අවශ්‍යතා මෙන්ම නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම සහ ප්‍රචණ්ඩ අන්තවාදයේ මූල හේතු ආමන්ත්‍රණය කිරීම සඳහා පුළුල් හා අන්තර් විනයානුකූල ප්‍රවේශයක් අවශ්‍ය වේ.**

**3. ත්‍රස්තවාදයේ විකාශනය වන තර්ජනය විසඳීම සඳහා ශ්‍රී ලංකාවට වෙනත් රටවල අත්දැකීම්වලින් පාඩම් ආදර්ශයට ගත හැකි අතරම දේශීය තත්ත්වයන්ට ඒවාට ප්‍රතිපත්ති අනුගත කළ හැකිය.**

---

### හැඳින්වීම

- ලක්ෂ්මන් කදිර්ගමාර් ආයතනය (එල්කේඅයි) ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සහාය ඇතිව "ත්‍රස්තවාදයේ සිට ප්‍රතිසාධනය දක්වා: ජාත්‍යන්තර අත්දැකීම්වලින් උගත් පාඩම්" යන මාතෘකාව යටතේ 2019 ජූලි 10 වන දින කමිටු සාකච්ඡාවක් පැවැත්විය.
- මණ්ඩලයේ සාමාජිකයින් වූයේ රූන්ඩ් කෝපරේෂන් හි ජ්‍යෙෂ්ඨ චර්යාත්මක විද්‍යාව පිළිබඳ ආචාර්ය ටොඩ් සී. හෙල්මස්, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ, ත්‍රස්ත මර්දන කාර්යාංශය සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි කලාපීය හා බහුපාර්ශ්වික කටයුතු පිළිබඳ නියෝජ්‍ය සම්බන්ධීකාරක ජෝන් ටී. ගොඩ්ෆ්‍රි මහතා, එක්සත් ජාතීන්ගේ හිටපු මහ ලේකම්, ළමුන් සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ විශේෂ නියෝජිත ආචාර්ය රාධිකා කුමාරස්වාමි සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා. එල්කේඅයි හි විධායක අධ්‍යක්ෂ ආචාර්ය ගනේෂන් විග්නරාජා විසින් සාකච්ඡාව මෙහෙයවන ලදී. ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති ඇලෙයිනා බී. ටෙප්ලිට්ස් මහතා සමාරම්භක දේශනය පැවැත්වීය.
- මෙම අවස්ථාවට රාජ්‍ය තාන්ත්‍රික ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් මෙන්ම අනෙකුත් රජයේ නිලධාරීන් සහ මාධ්‍ය නියෝජිතයින්, චින්තකයින් සහ පෞද්ගලික අංශය ඇතුළු 150කට අධික පිරිසක් සහභාගී වූහ.

## සාකච්ඡාවෙන් මතු වූ ප්‍රධාන කරුණු:

<u>ආරක්ෂාව ශක්තිමත් කිරීම</u>

- අයිඑස්අයිඑස් විසින් ක්‍රියාවට නංවන ලද නව ත්‍රස්තවාදයන් අල්කයිඩා කණ්ඩායම් විසින් මහා පරිමාණයෙන්, මධ්‍යගත හා සමීපව සම්බන්ධීකරණය කරන ලද ප්‍රහාරවලින්, සුළු පිරිසක් විසින් සැළසුම් කර ගෙන යන ක්‍රියාවන් දක්වා විකාශනය වී ඇති අතර ඒවා නිරන්තරව සිදු වේ. මෙය ඔවුන්ට ලුහුබැඳීමට සහ හසුකිරීමවලට වඩාත් අපහසු කරයි.

- නැගී එන මෙම තර්ජනයට මුහුණ දීම සඳහා අනුපූරක මෘදු හා දැඩි ප්‍රවේශයක් අවශ්‍ය බව එක්සත් ජනපද හා උතුරු අප්‍රිකානු අත්දැකීම්වලින් පෙනී යයි.

දැඩි ප්‍රවේශයේදී සාම්ප්‍රදායික නීතිය බලාත්මක කිරීම, බුද්ධි රැස් කිරීම සහ දේශසීමා පාලන ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

මෘදු ප්‍රවේශයේදී සඳහා විශේෂයෙන් අවදානමට ලක්විය හැකි තරුණ තරුණියන් රැඩිකලීකරනය, බලමුලු ගැන්වීම සහ බඳවා ගැනීම වැළැක්වීම සඳහා ප්‍රජා නායකයින් සමඟ සමීප සම්බන්ධතාවයක් අවශ්‍ය වේ.

- මෙම ප්‍රවේශයන්ගේ සංයෝජනය සකස් විය යුත්තේ සුළුතර කණ්ඩායම්වලට ඔවුන්ගේ යහපත උදෙසා බව හැඟෙන ආකාරයටයි.
- ජාත්‍යන්තර අත්දැකීම්වලින් පෙනී යන්නේ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින්, විශේෂයෙන් සිවිල් සමාජ කණ්ඩායම් සහ රාජ්‍ය නොවන සංවිධාන හරහා පවත්වන විට ඒවා වඩාත් ඵලදායක වන බවයි.

<u>සමාජ මාධ්‍යවල කාර්යභාරය</u>

නවසීලන්තය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වැනි රටවල මෑතකදී සිදු වූ ත්‍රස්ත ප්‍රහාරවලින් පසුව, සමාජ මාධ්‍ය සමාගම් ක්‍රමයෙන් අන්තවාදී මතවාද ප්‍රචාරය කරන කණ්ඩායම් සහ පුද්ගලයින් ඉවත් කිරීමට ස්වයං-නියාමනය සඳහා වඩාත් සක්‍රීයවී ඇත.

අතථ්‍ය පුද්ගලික ජාල (වීපීඑන්) තිබීම නිසා ත්‍රස්ත සිදුවීම් අතරතුරදී, සමාජ මාධ්‍ය, පූර්ණ වශයෙන් තහනම් කිරීම් හෝ වාරණයක් ආකාරයෙන්, ප්‍රවේශවීම ප්‍රතික්ෂේප කිරීම ඵලදායී නොවනු ඇත. එමෙන්ම, දීර්ඝ තහනම් කිරීම් ඩිජිටල් ආර්ථිකයට විශාල හානියක් සිදු කරයි. ඒ අනුව, නියාමනය ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන්ට අනුකූලව සීමිත හා ඉලක්කගත ආකාරයකින් කළ යුතුය.

ත්‍රස්තවාදී අර්බුදයක් පවතින කාලවලදී රජයන් සිය පැවැත්ම පිළිවෙලට පවත්වා ගෙන යාම සඳහා සහ ඔවුන්ගේ තොරතුරු සන්නිවේදනයන් වැඩි දියුණු කළ යුතුය.

සමාජ මාධ්‍ය හරහා බෙදාගන්නා තොරතුරු වල නිරවද්‍යතාවය විනිශ්චය කිරීම සඳහා පුද්ගලයන්ට සහ ආයතනවලට උපකාර කිරීම සඳහා දේශීය ඉඩකඩ වර්ධනය කළ යුතුය.

<u>පාලනය</u>

ත්‍රස්තවාදයේ නාමයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අනවශ්‍ය ලෙස උල්ලංඝනය නොකිරීමට සමාජයන් සුපරීක්ෂාකාරී විය යුතුය. නිදසුනක් වශයෙන්, ව්‍යතිරේකයේ තත්ත්වය (නීතියේ ආධිපත්‍යය ඉක්මවා යාමේ හැකියාව) අර්බුදයකදී අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා නොයා යුතුය.

යුක්තිය අත්තනෝමතික ලෙස සිදු වීම වැළැක්වීම සඳහා ත්‍රස්තවාදී සටන්කරුවන් සිවිල් වැසියන්ගෙන් වෙන්කර හඳුනා ගැනීමට වැඩි උත්සාහයක් ගත යුතුය.

උතුරු අයර්ලන්තයේ සහ දකුණු අප්‍රිකාවේ අත්දැකීම්වලින් පෙනී යන්නේ ත්‍රස්ත මර්දන ප්‍රයත්නයන්හි ආරක්ෂක අංශයට පමණක් ක්‍රියාත්මක විය නොහැකි බවයි. රැඩිකලීකරණයේ සහ ප්‍රචණ්ඩ අන්තවාදයේ මූල හේතු විසඳීම සඳහා එය දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සමඟ බද්ධ විය යුතුය.

ප්‍රධාන අභියෝගය වන්නේ ආගමික හා ජනවාර්ගිකත්වය හරහා සහයෝගීතාව පිළිබඳ වැඩි හැඟීමක් ගොඩනැගීමයි. මේ සඳහා සාධාරණ හා කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් අවශ්‍යයි.

## කම්පනවලට ඔරොත්තු දෙන ආර්ථිකයක් ගොඩනැගීම

ත්‍රස්තවාදී ප්‍රහාර, ආර්ථික ක්‍රියාකාරකම්වලට සැළකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකිය. උදාහරණයක් ලෙස, 2002 බාලි හි බෝම්බ ප්‍රහාර එහි සංචාරක අංශයට විශාල බලපෑමක් ඇති කළේය. පාස්කු ඉරිදා ප්‍රහාරයන් ශ්‍රී ලංකා ආර්ථිකයට සැලකිය යුතු සෘණාත්මක කම්පනයක් ඇති කළේය. කෙසේ වෙතත්, මූල්‍ය වෙළෙඳපොලවලට හෝ ඉදිරි ණය ආපසු ගෙවීම් සඳහා මුදල් යෙදවීමට රජයට ඇති හැකියාව කෙරෙහි විශාල බලපෑමක් සිදු වී නොමැත.

මේ ආකාරයේ බාහිර කම්පනය පෙන්නුම් කරන්නේ ක්ෂණික ආර්ථික බිඳවැටීම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් බවයි. වර්ෂ 1996දී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් පසුවද එවැනි සැළසුම් පවත්වා ගෙන ගොස් ඇති අතර ඒවා දැන් මූල්‍ය අංශය පුරා ආයතනිකකරණය වී තිබේ.

මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති අනපේක්ෂිත සිදුවීම්වලට ප්‍රතිචාර දැක්විය හැකි අතර ණය ආපසු ගෙවීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් සාර්ව ආර්ථික අවරෝධකයක් පවත්වා ගැනීම ද වැදගත් ය.

## ශ්‍රී ලංකාව සඳහා ඇඟවුම්

ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින ත්‍රස්තවාදයේ තර්ජනය විසඳීම සඳහා බුද්ධි තොරතුරු එක්රැස් කිරීම මෙන්ම තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියා පටිපාටි ඉතා වැදගත් වේ. රැඩිකලීකරණය වැළැක්වීම සඳහා ප්‍රජා මට්ටමින් වඩාත් සමීපව සම්බන්ධ වීම සමඟ එය ඒකාබද්ධ කළ යුතුය.

ශ්‍රී ලංකාව වැනි රටවල, විශේෂයෙන් ස්වභාෂාවලින් ඔවුන්ගේ අධීක්ෂණය වැඩි කිරීම සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීම පිළිබඳව සමාජ මාධ්‍ය සමාගම් සලකා බැලිය යුතුය. සාවද්‍ය තොරතුරු පැතිරවීමට දායක නොවන බවට සහතික කිරීම සඳහා ප්‍රාදේශීය මාධ්‍ය සංවිධානවලටද වැදගත් කාර්යභාරයක් ඇත.

ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස නැවත වර්ගීකරණය කර ඇති හෙයින්, එය දිගින් දිගටම දූරදර්ශී සාර්ව ආර්ථික කළමනාකරණය සිදු කළ යුතු අතර ක්‍රමයෙන් අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අනුගමනය කළ යුතුය. ත්‍රස්තවාදයෙන් ඇතිවිය හැකි කඩාකප්පල් කිරීම් ඇතුළු අනාගත කම්පනවලට ආර්ථිකය ඔරොත්තු දෙන බව සහතික කිරීමට මෙය උපකාරී වේ.

** ඇඩම් කොලින්ස් කොළඹ ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා උපායමාර්ගික අධ්‍යයන ආයතනයේ (LKI) පර්යේෂණ සාමාජිකයෙකි. මලින්ද මීගොඩ එම ආයතනයෙහි පර්යේෂණ සහායකයෙකි. LKI Take aways LKI පවත්වනු ලබන වැඩසටහනින් උපුටා ගනු ලබූ මූලික සාරාංශය වේ. ඒවා වාර්තාකරණ කතුවරුන්ගේ අදහස් හෝ LKI හි ආයතනික අදහස් නොවන අතර මෙය සිදුවීම පිළිබඳ සම්පූර්ණ වාර්තාවක්ද නොවේ.*

**යෝජිත කියවීම්:**


Wignaraja, G. (2019). *Five Key Policy Lessons from the Terror Attacks in Sri Lanka.* Lakshman Kadirgamar Institute. [Online] Available at: https://www.lki.lk/blog/five-key-policy-lessons-from-the-terror-attacks-in-sri-lanka/

Meegoda, M. (2019). *Developing a '3C' Security Strategy for Sri Lanka.* Lakshman Kadirgamar Institute. [Online] Available at: https://www.lki.lk/blog/developing-a-3c-security-strategy-for-sri-lanka/

Hussain, N. (2019). *4/21 and the Way Forward for Sri Lanka's Social Media Landscape.* Lakshman Kadirgamar Institute. [Online] Available at: https://www.lki.lk/blog/4-21-and-the-way-forward-for-sri-lankas-social-media-landscape/

Helmus, T., and Klein, K. (2018). *Assessing Outcomes of Online Campaigns Countering Violent Extremism. Rand Corporation.* [Online] Available at: https://www.rand.org/pubs/research_reports/RR2813.html

Collins, A. (2019). *Should Sri Lanka Stick with the IMF?* Lakshman Kadirgamar Institute. [Online] Available at: https://www.lki.lk/blog/should-sri-lanka-stick-with-the-imf/